# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,490 - 2026 මැයි මස 22 සිකුරාදා - 2026.05.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 128 |
| බුද්ධල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 134 |


*සැ. යු.* - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2026 අප්‍රේල් මස 24 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූනි මස 12 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 29 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


127 - B 082795 — - (2026/05)
C 1 -

# පිස්කල් විකිණීම්

**මාවනැල්ල දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

*කොළඹ දිසා අධිකරණයේ*
*නඩු අංකය* : DMB/129/2018
*මාවනැල්ල දිසා අධිකරණයේ*
*ඇස්කිසි අංක* : 02/26

*...........පැමිණිලිකරු.*

*එදිරිව*

1. හෙට්ටිආරච්චිලාගේ දයා අමරසිංහ *නොහොත්* හේවා පේඩිගේ දයා අමරසිංහ, අංක ඩී 31, රුවන්දෙණිය, දෙවනගල.

2. සුසිලා යමුනා කුමාරි රාජකරුණා, අංක ඩී 31, රුවන්දෙණිය, දෙවනගල.

*..........විත්තිකරුවන්.*

මෙම නඩුවේ වර්ෂ 2024 ක් වූ ජූලි මස 29 දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව රුපියල් තිස් හතර ලක්ෂ හතළිස් නව දහස් හයසිය පනහයි ශත හතක (රු. 3,449,650.07) මුදලක් ද, එකී මුදල මත 2018.04.01 දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා 15% බැගින් වන පොළිය ද, ඉන් පසු තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශිත මුදල ගෙවා අවසන් වන තෙක් සමස්ත මුදල මත 15% බැගින් වන වැඩිදුර පොලිය, වර්ෂ 2024 ක් වූ ජූලි මස 29 දින දරන අධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරුගෙන් අයකර ගනු ලැබිය යුතු වූ ඉහත සඳහන් අයවිය යුතු මුදල්, නෛතික පොළිය සහ අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු පැමිණිලිකරුට අයකර දීම සඳහා මාවනැල්ල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් තහනමට ගන්නා ලද පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපල,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 01 දින පෙරවරු 10.30 ට,**

එම නිශ්චල දේපළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළේ මැද පත්තුවේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරණායක ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත අංක 33 C රුවන්දෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රුවන්දෙණිය ගමේ පිහිටි "අළදගහපිටියේ වත්ත *හෙවත්* හිටිනාවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එස්. එම්. අප්වාඩ් විසින් මැන සකස් කරන ලද 2007.09.15 දිනැති අංක 5310 A/2007 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්,

උතුරට : බලයලත් මිනින්දෝරු එම්. එස්. එම්. එස්. එම්. අප්වාඩ් විසින් සාදන ලද අංක 5310/2007 දරන පිඹුරේ ලොට් 01 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : එකී අංක 5310/2007 පිඹුරේ ලොට් 01 හි ඉතිරි කොටස ද, දකුණට : ඇතුගල් පේඩිගේ වත්ත වෙන් කරන පාර ද, සහ බස්නාහිරට : පාර සහ අලුපොත සිට මාවනැල්ලට යන පාර, හෙම්මාතගම පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හතයි පහයි අටක් (හෙ. 0.0758) විශාල ඉඩම වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 61/105 හි ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් කරන ලද ඉඩම පහත විස්තර කරන ඉඩමේ උප බෙදීමකි.

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළේ මැද පත්තුවේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරණායක ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත අංක 33 C රුවන්දෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රුවන්දෙණිය ගමේ පිහිටි "අළදගහපිටියේ වත්ත *හෙවත්* හිටිනාවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එස්. එම්. අප්වාඩ් විසින් මැන සකස් කරන ලද 2007.01.18 දිනැති අංක 5310 /2007 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්,

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : ඉනි සහ කම්බි වැට සහ මුස්තාපාගේ ඉඩම ද, දකුණට : ඇතුගල් පේඩිගේ වත්ත වෙන් කරන පාර ද සහ බස්නාහිරට : පාර සහ අලුපොත සිට මාවනැල්ලට යන පාර, හෙම්මාතගම පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහහතරක් (අ. 01, පර්. 14) විශාල ඉඩම වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 776/224 හි ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් කරන ලද ඉඩම පහත විස්තර කරන ඉඩමේ නැවත මැනීමකි.

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළේ මැද පත්තුවේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරණායක ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත අංක 33 C රුවන්දෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රුවන්දෙණිය ගමේ පිහිටි "අළදගහපිටියේ වත්ත *හෙවත්* හිටිනාවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. බී. බැද්දේවෙල විසින් මැන සකස් කරන ලද 1960.04.24 දිනැති අංක 797 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්,

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : මුස්තාපාගේ ඉඩම ද, දකුණට : ඉනි සහ කම්බි වැට සහ ඇතුගල් පේඩිගේ වත්ත ද, සහ බස්නාහිරට : අඩි පාර සහ හිඟුළ සිට අල්පිටියට යන ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහහතරක් (අ. 1 පර්. 14) විශාල ඉඩම වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 776/11 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාවනැල්ල.

වර්ෂ 2026 ක් වූ මැයි මස 14 දින දී ය.

05 - 337

---

## කෑගල්ල දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

*කොළඹ දිසා අධිකරණ*
*නඩු අංක* : DMB/179/2015
*කෑගල්ල දිසා අධිකරණ*
*ඇස්කිසි අංක* : 01/2025

*............පැමිණිලිකරු.*

*එදිරිව*

1. රණවීර ආරච්චිලාගේ චමින්ද දිල්රුක් සෙනෙවිරත්න
2. රණවීර ආරච්චිලාගේ මහේෂ් චන්දන සෙනෙවිරත්න

*දෙදෙනාම*

අංක 28, බෙලිගස් පාර, පිටිහුම,
කෑගල්ල.

*...........විත්තිකරුවන්.*

මෙම නඩුවේ වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 08 දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව රුපියල් දහසය ලක්ෂ අනූනව දහස් හාරසිය අසූ තුනයි ශත හැට (1,699,483.60) මුදලක් ද, එකී මුදල සම්පූර්ණයෙන්ම ගෙවා නිමවන තෙක් වර්ෂ 2015.03.01 දින සිට වර්ෂයකට 24% ක අනුපාතයට ඒ මත වන පොලිය ද, ඉන් පසු තීන්දු ප්‍රකාශයේ දින සිට තීන්දු ප්‍රකාශිත මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් සමස්ත මුදල මත 24% ක අනුපාතය බැගින් වන පොලිය, බැංකු ගාස්තු සහ අනිකුත් ව්‍යවස්ථාපිත ගාස්තු වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 08 දින දරන අධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරුගෙන්

අයකර ගනු ලැබිය යුතු වූ ඉහත සඳහන් අයවිය යුතු මුදල්, නෛතික පොළිය සහ අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු පැමිණිලිකරුට අයකර දීම සඳහා කෑගල්ල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් තහනමට ගන්නා ලද පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපල,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 01 දින පස්වරු 2.00 ට,**

එම නිශ්චල දේපළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළේ, වල්ගම්පත්තුවේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රඹුක්කන ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත මාදන පිහිටි 'දිඹුල්ගමුආව හිටියාවත්ත *නොහොත්* බෝදවලයාය හිටියාවත්ත' නමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් මැන සාදන ලද අංක 7776/2012/කේපී දරන පිඹුරේ ලොට් 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්,

උතුරු-නැගෙනහිරට සහ දකුණු නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් මැන සාදන ලද අංක 545/96/කේපී දරන පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණු කළ පාර ද, දකුණු - බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් මැන සාදන ලද අංක 545/96/කේපී දරන පිඹුරේ ලොට් 5 වෙන් කරන ලද සීමාව ද සහ උතුරු-බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් මැන සාදන ලද අංක 545/96/කේපී දරන පිඹුරේ ලොට් 01 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිහයි දශම අට (රූ. 1, පර්. 30.8) ක් විශාල ඉඩම සහ එහි සියලු දේ සහ එකී පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණු කළ මාර්ගය සහ පොදු පහසුකම් භුක්ති විඳීමේ අයිතිය ද සමග වේ.

ඉහත ඉඩම මෙහි පහත විස්තර කරන ඉඩමේ නැවත මැනීමකි.

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළේ, වල්ගම්පත්තුවේ මාදන පිහිටි 'දිඹුල්ගමුආව හිටියාවත්ත *නොහොත්* බෝදවලයාය හිටියාවත්ත' නමැති ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් මැන සාදන ලද අංක 545/96/කේපී හා 1996.02.24 දින දරන පිඹුරේ ලොට් 04 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්,

උතුරු-නැගෙනහිරට සහ දකුණු නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණු කළ පාර ද, දකුණු - බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 5 වෙන් කරන ලද සීමාව ද සහ උතුරු-බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 01 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිහයි දශම අට (රූ. 1, පර්. 30.8) ක් විශාල ඉඩම සහ එහි සියලු දේ සහ එකී පිඹුරේ ලොට් 03 වශයෙන් ලකුණු කළ මාර්ගය සහ පොදු පහසුකම් භුක්ති විඳීමේ අයිතිය ද සමග වේ.

මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 531/34 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කෑගල්ල.

වර්ෂ 2026 ක් වූ මැයි මස 14 දින දී ය.

05 - 338

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන කොළඹ දී පවත්වනු ලබන වාණිජ මහාධිකරණයේ දී ය

1995 අංක 11 දරන බේරුම්කරණ පනතේ VII වන කොටසේ 31 (1) වගන්තිය යටතේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා මහාධිකරණයෙන් ඉල්ලීමේ කාරණාව සම්බන්ධයෙනි.

ඒෂියා ඇසට් ෆයිනෑන්ස් පීඑල්සී.,
අංක 76/1, ධර්මපාල මාවත,
කොළඹ 03.

*නව ලිපිනය :*

අංක 76, උද්‍යාන වීදිය,
කොළඹ 02.

*...........පෙත්සම්කරු.*

*නඩු අංකය* : CHC/664/2020/ARB
*කාර්ය පටිපාටිය* : ලඝු
*ස්වභාවය* : බේරුම්කරණය
*වටිනාකම* : රු. 24,120,000/-

*එදිරිව*

හේරත් මුදියන්සේලාගේ මංජුල දිල්ෂාන්,
බණ්ඩාර හේරත්,
අංක 145, මෝදර වත්ත,
කුරුණෑගල.

*..........වගඋත්තරකරු.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2024 ක් වූ ජූලි මස 30 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පෙත්සම්කාර ආයතනය වෙත ගෙවිය යුතු රුපියල් දහ අට මිලියන හත් ලක්ෂ විසි දහසක (රු. 18,720,000/-) මුදලින් කිසිදු මුදලක් ගෙවා නොමැති බැවින් ඒ අනුව, එකී මුදල අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ සඳහන් දේපළට ඇස්කීසි ක්‍රියාත්මක කිරීමට පෙත්සම්කරුට අවසර දී ඇති බවට තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට වග උත්තරකරු අපොහොසත් වී හෝ පැහැර හැර ඇති හෝ බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2026 ක් වූ ජනවාරි මස 27 දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් වග උත්තරකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2026ක් වූ ජූනි මස 17 දින පෙ. ව. 10.00 ට,**

ඉහත නම් සඳහන් වගඋත්තරකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛන අංක 01**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවන්න සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 09 දරන කොටසට මායිම්ව,

උතුරට : ලොට් 08 ද,
නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද,
දකුණට : R2 දරන අඩි 20 ක් පළල පාර ද,
බස්නාහිරට : ලොට් 10 ද,

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/67 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 02**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවන්න සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 10 දරන කොටසට මායිම්ව,

| | | |
|---|---|---|
| උතුරට | : | ලොට් 08 ද, |
| නැගෙනහිරට | : | ලොට් 09 ද, |
| දකුණට | : | R2 දරන අඩි 20 ක් පළල පාර ද, |
| බස්නාහිරට | : | එම |

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/68 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 03**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවන්න සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 11 දරන කොටසට මායිම්ව,

| | | |
|---|---|---|
| උතුරට | : | ලොට් 07 ද, |
| නැගෙනහිරට | : | R2 දරන අඩි 20 ක් පළල පාර ද, |
| දකුණට | : | H. M. කලුබන්ඩා හිමිකම් කියන ඉඩම, |
| බස්නාහිරට | : | එම |

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/69 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 04**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවන්න සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 12 දරන කොටසට මායිම්ව,

| | | |
|---|---|---|
| උතුරට | : | ලොට් 11 සහ R2 දරන අඩි 20 ක් පළල පාර, |
| නැගෙනහිරට | : | ලොට් 13 සහ ලොට් 14, |
| දකුණට | : | ලොට් 15 සහ උක්කුබණ්ඩා සහ ජයතිලක හිමිකම් කියන ඉඩම, |
| බස්නාහිරට | : | උක්කුබණ්ඩා, ජයතිලක සහ H. M. කලුබන්ඩා හිමිකම් කියන ඉඩම |

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/70 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 05**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවත්ත සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 13 දරන කොටසට මායිම්ව,

උතුරට : R2 දරන අඩි 20 ක් පළල පාර,
නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද,
දකුණට : ලොට් 14
බස්නාහිරට : ලොට් 12

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/71 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 06**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවත්ත සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 14 දරන කොටසට මායිම්ව,

උතුරට : ලොට් 13,
නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර,
දකුණට : ලොට් 15
බස්නාහිරට : ලොට් 12

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/72 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 07**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරී වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවත්ත සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජූලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 15 දරන කොටසට මායිම්ව,

උතුරට : ලොට් 12, 14,
නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර,
දකුණට : ලොට් 16 සහ උක්කුබණ්ඩා හිමිකම් කියන ඉඩම,
බස්නාහිරට : උක්කුබණ්ඩා හිමිකම් කියන ඉඩම,

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/73 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

**උපලේඛන අංක 08**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වල්ගම්පත්තු කෝරළයේ, දේවමැදි පත්තුවේ, වාරියපොළ ප්‍රාදේශීය සභාවේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලව දම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, පල්ලව දම්පිටිය ග්‍රාමයේ කනාටුවත්ත *හෙවත්* හිටිනාවත්ත ගොඩවන්න සහ කහටගහමුල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ආරියරත්න මහතා විසින් වර්ෂ 2017 ජුලි 9, 10 දින මැන සාදන ලද අංක 1797 දරන පිඹුරේ කැබලි අංක 16 දරන කොටසට මායිම්ව,

| | | |
|---|---|---|
| උතුරට | : | ලොට් 15, |
| නැගෙනහිරට | : | ප්‍රාදේශීය සභා පාර ද, |
| දකුණට | : | උක්කුබණ්ඩා හිමිකම් කියන ඉඩම, |
| බස්නාහිරට | : | උක්කුබණ්ඩා හිමිකම් කියන ඉඩම, |

යන මායිම්වලින් වටවූ පර්චස් පහළොවක් (පර්. 15) විශාලත්වයෙන් යුතු බිම් පෙදෙස හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදි සියලු දේ ද වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Q 118/74 දරන පත්තිරුවේ ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ :

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25% ක් එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ගෙවිය යුතු ය.

කේ. ජී. ලක්ෂ්මි ද සිල්වා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
මහාධිකරණය,
කුරුණෑගල.

වර්ෂ 2026 ක් වූ මැයි මස 15 දින දී ය.

05-343

---

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

### 1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයේ අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ දේවානන්ද සුරවීර වන මම මෙයින් දැනුම් දෙන්නේ "1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත" යන මාතෘකාව යටතේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මා යෝජනා කරන බවයි.

ප්‍රධාන පනතට යම් යම් සංශෝධන හඳුන්වා දීම මෙම සංශෝධන පනත් කෙටුම්පතේ අරමුණ වේ.

දේවානන්ද සුරවීර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

05 - 246

## පාර්ලිමේන්තුව

### මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

දේවානන්ද සුරවීර වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී භාරකාරත්වය සංස්ථාගත කිරීමයි:-

(*අ*) අරමුණු සහ අනාගත රැකියා අවස්ථාවන්ට මුහුණ දීමට යෞවන යෞවනියන් වඩාත් හොඳින් සූදානම් කිරීමට ඉගෙනීම් සහ නිපුණතා වර්ධන වැඩසටහන් මෙහෙයවීම ;

(*ආ*) තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම ;

(*ඇ*) දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන යෞවන යෞවනියන් සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවාවන් ලබා දීම සහ/හෝ පිළියෙළ කිරීම ; සහ

(*ඈ*) නිපුණතා සහ ඉගෙනීම වර්ධනය කිරීමට කලින් කල අවශ්‍ය වැඩසටහන් මෙහෙයවීම,

යනාදිය වේ.

දේවානන්ද සුරවීර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

05 - 247

---

## නොතීසිය

### කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ දී ය
### (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන)

*නඩු අංකය* : CHC/18/2026/CO
*ස්වභාවය* : ගණන් බලා වසා දැමීම (සමාගම)

2007 අංක 07 දරන සමාගම් පනතේ (සංශෝධිත පරිදි) 270 වගන්තිය යටතේ සහ ඒ ප්‍රකාරව, ගාල්ල, හිරිඹුර පාර, අංක 150 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සිංහ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් ((PB 214009) නම් සමාගම අධිකරණය විසින් ගණන් බලා වසා දැමීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පතක් සම්බන්ධයෙනි.

එස්. ඒ. ඩී. සිරිවර්ධන,
අංක 1272, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

..................*පෙත්සම්කරු.*

කොළඹ දී සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ ගරු විනිසුරුවරුන් වෙත,

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 වගන්තිය යටතේ සහ ඒ ප්‍රකාරව, සිංහ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් (PB 214009) නම් සමාගම ගණන් බලා වසා දැමීම සඳහා නියෝගයක් ලබා ගැනීම පිණිස, ඉහත නම් සඳහන් පෙත්සම්කරු වන එස්. ඒ. ඩී. සිරිවර්ධන විසින් 2026 මාර්තු මස 23 දින මෙම ගරු අධිකරණයට ගණන් බලා වසා දැමීමේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවට මෙයින් නොතීසි ලබා දේ.

මෙම අයදුම්පත **2026 මැයි මස 27 දින නොතීසි ආපසු කැඳවීම සඳහා ද, 2026 ජූලි මස 01 දින පෙරවරු 9.30 ට කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝර්ප්හි පිහිටි අංක 03 වාණිජ මහාධිකරණයේ විභාගය සඳහා ද කැඳවනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.**

එකී සමාගමේ යම් ණයහිමියෙකුට හෝ සහදායකයෙකුට හෝ එකී අයදුම්පත සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කිරීමට සහාය දීමට හෝ විරුද්ධ වීමට හෝ අවශ්‍ය වන්නේ නම්, නඩු විභාගය පවත්වන අවස්ථාවේ දී එයට පෙනී සිටිය හැකි ය.

පෙත්සම්කරුගේ නීතිඥ :

රම්සි බචා ඇසෝසියේට්ස්,
අංක 367/3/1, වේල්ල වීදිය,
කොළඹ 12.

දුරකථන : 0112 432433, 0772 650522
විද්‍යුත් තැපැල : ramzibachaassociates@gmail.com

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්/සහකාර රෙජිස්ට්‍රාර්,
කොළඹ වාණිජ මහාධිකරණය.

වර්ෂ 2026 ක් වූ මැයි මස 22 දින දී ය.

05 - 320

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.